# 7. කලිමතුත් තම්ජීද්

سُبْحَانَ اللهِ وَالْحَمْدُ لِلهِ

وَلَا إِلَهَ إِلَّا اللهُ وَاللهُ أَكْبَرُ

وَلَا حَوْلَ وَلَا قُوَّةَ إِلَّا بِاللهِ الْعَلِيِّ الْعَظِيمِ

මෙහි තේරුම

අල්ලාහ් පිවිතුරු ය. සියලු ප්‍රශංසාවක් ම අල්ලාහ්ට ම ය. අල්ලාහ් හැර නැමදීමට වෙනත් සුදුස්සකු නොමැත. අල්ලාහ් අතිශ්‍රේෂ්ඨ ය. ඉතා උසස් වූ ද, අතිඋතුම් වූ ද, අල්ලාහ්ගේ උදවු උපකාර නොමැති ව (කිසි ම දෙයකට හෝ කිසිවකුට) ශක්තියක් හෝ බලයක් හෝ නොමැත.

## පැවරුම්

**පහත සඳහන් වාක්‍ය හරි නම් "✓" ලකුණ ද වැරැදි නම් "×" ලකුණ ද වරහන් තුළ යොදන්න.**

1. සෑම ප්‍රශංසාවක් ම හිමිවන්නේ අල්ලාහ්ට ම ය. (   )
2. නැමදීමට සුදුස්සා අල්ලාහ් පමණකි. (   )
3. අල්ලාහ්ගේ උදවු උපකාර නොමැති ව ඕනෑ ම දෙයක් කළ හැකි ය. (   )
4. අල්ලාහ් පිවිතුරු යැයි පවසමි. (   )
5. අල්ලාහ් සියලු ම වස්තූන් කෙරෙහි බලසම්පන්න ය. (   )